# ගම්මන්පිල ප්‍රදේශයේ කබොක් ගල් කර්මාන්තය පිළිබඳ අධ්‍යයනයක්.

**දිල්හාරා පී.ඩී.පී.**[1]

අතීතයේ සිට ශ්‍රී ලංකාවේ සාම්ප්‍රදායික කර්මාන්තයන් අතර වූ කබොක් ගල් කර්මාන්තයට වර්තමානය තුළ හිමි වී ඇත්තේ අඩු සැලකිල්ලකි. ඒ අනුව සාම්ප්‍රදායික තාක්ෂණය මත ගොඩනැගුණු කර්මාන්තයක් ලෙස කබොක් ගල් කර්මාන්තය පිළිබඳ ව හඳුන්වාදීමට පුලුවන. වත්මන් ලාංකික සමාජය තුළ මිනිසාගේ තාක්ෂණික දියුණුවත් සමඟ දේශීයත්වයෙන් තමන්හට උරුම වූ දේශීය කර්මාන්තයක් ලෙස හඳුන්වනු ලැබෙන කබොක් ගල් කර්මාන්තය පිළිබඳ ව අධ්‍යයනය කිරීම සඳහා තෝරා ගනු ලැබුවේ ක්ෂේත්‍ර ගවේෂණ ක්‍රමවේදය යි. මෙහි අරමුණ වන්නේ යටපත් වී තිබෙන කබොක් ගල් කර්මාන්තය නැවත නගා සිටුවීම යි. ඒ අනුව බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, බණ්ඩාරගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් රයිගම් කෝරළයෙහි පිහිටි සුන්දර ගම්මානයක් වන ගම්මන්පිල ප්‍රදේශය තුළ වර්තමානයේ ඉතා සුළු පරිමාණයෙන් පවත්වාගෙන යනු ලබන කබොක් ගල් වළක් ආශ්‍රය කොට ගෙන මෙම අධ්‍යයනය සිදු කරන්නට විය. දැනට පොදු නිරීක්ෂණ සහ සම්මුඛ සාකච්ඡාවන්ට අනුව සිය රැකියාව සේ ම පරම්පරාවෙන් රැගෙන ආ දැනේ කර්මාන්තය ලෙස ඔවුන් කබොක් ගල් කැපීමට මුලපුරා තිබෙන බව හඳුනාගත හැකි විය. එහෙත් වර්තමානයේ ඔවුනගේ දරුවන් මෙම කර්මාන්තය කෙරෙහි අවධානයක් යොමු නොකරති. ඔවුන් ද පවසා සිටින්නේ තමන්හට පරම්පරාවෙන් උරුම වුව ද තම දරුවන්ට මෙම කර්මාන්තය සිදු කරගෙන යාමට අවස්ථාවක් නොදෙන අතර, ඔවුනට අධ්‍යාපනය ලබා දී වෙනත් රැකියාවල නිරතවීමට මංපෙත් සලසන බව යි. ඉතා ශක්තිමත් ඉදිකිරීම් ද්‍රව්‍යයක් ලෙස වසර 100කට අධික කලක් තිස්සේ මෙම කබොක් ගල් කර්මාන්තය පැවත එන බව පැරණි සාධක අනුව නිගමනයන්ට එළඹිය හැකි ය. මෙහි පිහිටීම, එහි ස්වභාවය, කබොක් ගල් කැපීමේ තාක්ෂණය හා ඒ සඳහා යොදා ගනු ලබන සාම්ප්‍රදායික වූ උපකරණ, කබොක් ගල් භාවිතයෙන් සිදු කරනු ලබන නිර්මාණ ආදිය පිළිබඳ සාකච්ඡාවට බඳුන් කිරීම සිදු කරන ලදි. එම නිර්මාණ අතර නිවාස ඉදිකිරීම්, ප්‍රාකාර ඉදිකිරීම්, පොකුණු ඉදිකිරීම්, නිවාස අලංකරණ, ජල පිරිපහදු ආදිය සඳහා කබොක් ගල් භාවිතය කෙසේ ද යන්නත්, එසේ ම අතීත, වර්තමාන තත්වයන් පිළිබඳ ව මෙන් ම මෙම කබොක් ගල් කර්මාන්තයේ පවතින නව ප්‍රවණතාවයන් ද කතාබහට ලක් වේ. විශේෂයෙන් දෙමුහුන් මාධ්‍ය භාවිතයෙන් කබොක් ගල් කර්මාන්තය වර්තමානය තුළ ස්ථාපිත වී තිබේ. ප්‍රධාන වශයෙන් මෙම අධ්‍යයනය තුළින් බලාපොරොත්තු වන්නේ සාම්ප්‍රදායික තාක්ෂණය යටතේ ගොඩනැගුණු කබොක් ගල් කර්මාන්තය පිළිබඳ අවබෝධයක් ලබා ගැනීම යි. ඊට අමතරව වර්තමානය තුළ මෙම කර්මාන්තය පසුබෑමට ලක්වීමට හේතු සොයා බලා ඒවාට පිළියම් යොදා නවීන ක්‍රම උපයෝගී කරගනිමින් මතු පරම්පරාවට දායාද කිරීමට වගබලා ගත යුතු ය.

**ප්‍රමුඛ පද :** කබොක් ගල්, සාම්ප්‍රදායික, වර්තමානය, තාක්ෂණය, කර්මාන්තය

---

[1] පුරාවිද්‍යා හා උරුම කළමනාකරණ අධ්‍යයන අංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය.
dilharagothami@gmail.com